**මොනරාගල ප්‍රාදේශීය සභාව - 2023**
-------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මොනරාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
| --- | --- | --- |
| (අ) ආසියානු සංවර්ධන බැංකුවේ නාගරික සංවර්ධන අංශ ව්‍යාපෘතිය මගින් ලබාදී තිබුණු ණය මුදලින් රු. 67,560,633 ක් ගෙවිය යුතු වුවත් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ එය රු. 2,552,912 ක් ලෙස රු. 65,007,721 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ණය ශේෂ තහවුරු කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ලිපි මගින් දැනුවත් කළද මෙතෙක් ඒ සම්බන්ධව පිළිතුරක් ලබාදී නොමැති බව | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) විවිධ තැන්පත් ලේඛනයේ ඇතුලත් රු. 3,827,500 ක තැන්පතු ශේෂයක් සමාලෝචිත වර්ෂයේ ආදායමට ගෙන තිබුණද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ තව දුරටත් තැන්පතු ශේෂය යටතේ දක්වා තිබුණි. | මෙම ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ජංගම ගිණුමේ ශේෂය රු. 9,652,717 ක් වුවත් එය රු. 11,363,337 ක් ලෙස රු. 1,710,620 ක් වැඩියෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | මෙම ගිණුම්කරණ දෝ්ෂය නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව | වටිනාකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ඈ) දේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) යටතේ සභාව විසින් ඉදිකරන ලද කුමාරදොල පාර වාහන නැවතුම් කර්මාන්තයේ වටිනාකම වූ රු. 10,074,653 ක් ඉඩම් හා ගොඩනැගිලි ගිණුමට දෙවරක් හරකර තිබුණි. | මෙම ගිණුම්කරණ දෝ්ෂය නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඉ) ජල ගාස්තු ලේඛනය අනුව 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ජල ගාස්තුව රු. 989,800 ක් වුවත් එය රු. 1,547,300 ක් ලෙස දැක්වීමෙන් ශේෂයන් දෙක අතර රු. 557,500 ක වෙනසක් පැවතුණි. | ජල ගාස්තු බිල් කිරීමේදී ඇති වූ දෝෂයන් සහ ශේෂයන් කපා හැරීම සඳහා අනුමැතියට යවා ඇති වටිනාකම් ලේඛනවලින් ඉවත් කිරීම නිසා ඇති වූ තත්ත්වයක් බව | පාලන ගිණුම් සහ ලේඛන සංසන්දනය කළ යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂය තුල සභාවට පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු පරිගණක යන්ත්‍රයක සහ ප්ලාස්ටික් ජල ටැංකියක වටිනාකම තක්සේරු කර ගිණුම්ගතකර නොතිබුණි. | තක්සේරු වටිනාකම ලබාගෙන ගිණුම්ගත කිරීමේ කටයුතු සිදුකර ඇත. | සභාවට ලැබෙන සියලු වත්කම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (උ) සමාලෝචිත වර්ෂය තුල වැඩ අවසන් කරන ලද රු. 30,411,233 ක බස් නැවතුම්පොල සනීපාරක්ෂක පහසුකම් සංකීර්ණයේ වටිනාකම රු. 29,610,709 ක් ලෙස රු. 800,524 ක් අඩුවෙන් ඉඩම් හා ගොඩනැගිලි ගිණුමට ගෙන තිබුණි. | ගිණුම්කරණ දෝෂය මේ වන විට නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව. | නිවැරදිව මුලා ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

## 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| එකතු වටිනාකම රු. 2,097,059,444 ක් වූ වත්කම් විෂයයන් 03 කට අදාලව හිමිකම් ඔප්පු, වෘත්තීය තක්සේකරුවන්ගේ වාර්තා, ස්ථාවර වත්කම් ලේඛනය සහ හිඟ හිටි වෙනත් ආදායම් ලේඛනය ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉඩම් මැන නිරවුල්කර ගැනීමෙන් පසු හිමිකම් ඔප්පු සකස් කර ගැනීමට සහ වෘත්තීය තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු කරන බව හා ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇති බව. | මූලා ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| **(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| 24(1) (අ) වගන්තිය | මාර්ග ඉන්වෙන්ට්‍රියේ මාර්ග 481 ක් ඇතුළත් කර තිබුණද මාර්ග 454 ක් ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. | මුදල් ලද විගස මෙම මාර්ග මැනුම් කර සිතියම්ගතකර ගැසට් පත්‍රයේ පලකරන බව. | මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනකර ගැසට් පත්‍රයේ පලකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2010 අගෝස්තු 17 දිනැති විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | වීථි පහන් ලේඛනය අනුව, වීථි පහන් 3116 ක් සවිකර තිබුණද, වීථි ආලෝකකරණය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගතවී නොතිබුණි. | විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත නොවීමට බලපාන කරුණු රාශියක් පවතින බැවින් ඉදිරියේදී මෙම තත්ත්වය පිළිබඳ තව දුරටත් අවධානය යොමුකරන බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) 2009 අප්‍රේල් 17 දිනැති 1597/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය | 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අනුමත කරන ලද ගොඩනැගිලි අයදුම්පත්‍ර 448 ක් අතුරින් ගොඩනැගිලි අයදුම්පත් 380 ක් පරීක්ෂා කර අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | ඉදිරියේ දී ඉදිකිරීම් සම්බන්ධව ප්‍රමාණවත් නියාමනයක් සිදු කරන බව. | බලප්‍රදේශයේ සිදුකරන ඉදිකිරීම් සම්බන්ධව නියාමනය කළ යුතුය. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 13,465,208 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 15,924,624 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 14,123,230 | 13,710,743 | 16,106,287 | 17,314,706 | 3,045,000 | 13,586,447 | 13,586,448 | 19,851,963 |
| (ii) | කුලී | 20,775,000 | 23,805,274 | 21,358,681 | 19,207,720 | 28,677,450 | 20,584,974 | 43,694,679 | 7,000,883 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,558,100 | 1,710,024 | 1,710,024 | - | 1,770,100 | 1,641,262 | 1,641,262 | - |
| (iv) | වෙනත් ආදායම් | 29,246,336 | 39,694,842 | 39,694,842 | - | 26,038,275 | 24,076,822 | 24,076,822 | - |
| | එකතුව | 65,702,666 | 78,920,883 | 78,869,834 | 36,522,426 | 59,530,825 | 59,889,505 | 82,999,211 | 26,852,846 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| **වරිපනම් හා බදු** | | |
| (අ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 13,710,742 ක් වූ වරිපනම් බදු ආදායමෙන් රු. 6,436,248 ක් හෙවත් සියයට 47 ක ප්‍රමාණයක් දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | බිල්කළ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු. 19,851,963 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් රු. 10,788,091 ක් හෙවත් සියයට 54 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට සැලසුම්කර ඇති බව. | හිඟ වරිපනම් කඩිනමින් අයකරගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2016 -2022 කාල පරිච්ඡේදයට අදාලව දේපල බදුදීම වෙනුවෙන් අයවිය යුතු රු. 9,914,947 ක කුලී ආදායම සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය පැවති කාල පරිච්ඡේදයට අදාල හිඟ ආදායම් කපා හැරීමට ආණ්ඩුකාර තුමා වෙත අනුමැතිය සඳහා යොමුකර ඇති බවත් මෙතෙක් අනුමැතිය ලැබී නොමැති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

<u>කුලී</u>

| | | |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 9,996,680 ක් වූ කඩ කාමර කුලී ආදායමෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු. 4,006,523 ක් අයකරගෙන නොතිබුණි. | කඩ කුලී නොගෙවන පාර්ශවයන්ට විරුද්ධව නඩු පැවරීමට සහ කොටස් වශයෙන් හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කරන බව. | බිල්කළ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු. 4,653,834 ක හිඟ කඩ කාමර කුලී ආදායමින් රු. 1,619,214 ක් හෙවත් සියයට 35 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් කොටස් වශයෙන් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

<u>වෙනත් ආදායම්</u>

| | | |
|---|---|---|
| (අ) 2023 වර්ෂයේ සිදුකරන ලද දැන්වීම් පුවරු සමීක්ෂණයට අනුව ප්‍රදර්ශනය කර තිබුණු දැන්වීම් පුවරු 109 ක් වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 345,900 ක දැන්වීම් පුවරු ගාස්තු අයකරගෙන නොතිබුණි. | හිඟ අයකිරීමට අදාල පාර්ශව දැනුවත් කර ඇති අතර මුදල් නොගෙවන්නේ නම් දැන්වීම් පුවරු සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගන්නා බව | දැන්වීම් පුවරු ගාස්තු අදාල වර්ෂය තුල අයකරගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 2,967,711 ක් සහ මුද්දර ගාස්තු රු. 29,068,930 ක් පැවතුණි. | හිඟ මුදල් අයකර ගැනීමට අදාල ආයතන වෙත ලිඛිතව දන්වා යවා ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

## 2.3 අධිභාර

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
| --- | --- | --- |
| ----------------------- | ------------------------------------ | ----------------- |
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂවල දී පනවන ලද අධිභාරයක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 129,580 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | අධිභාර පනවන ලද අදාල පාර්ශවයන් මේ වන විට මිය ගොස් ඇති අතර ඉදිරි ක්‍රියාමාර්ග සඳහා අදාල තොරතුරු පළාත් පාලන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති බව. | නියමිත කාල පරිච්ඡේදයන් තුල අධිභාර මුදල් අයකරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාය‍ර්යන් ඉටුකිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
| --- | --- | --- |
| ----------------------- | ------------------------------------ | ---------------- |
| 2022 නොවැම්බර් 18 දිනැති අංක 3122 දරන ගැසට් පත්‍රය මගින් සභාව විසින් කසල ශෝධනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු අයකල යුතු බව දක්වා තිබුණද 2023 වර්ෂයට අදාලව කසල සඳහා ගාස්තු අයකළ යුතු ආයතන හඳුනාගෙන අදාල ගාස්තු අයකර ගෙන නොතිබුණි. | අදාල අතුරු ව්‍යවස්ථාවට අනුව ඉදිරියේදී කසල සඳහා අනුව අයකිරීමට කටයුතු කරන බව. | අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව අදාල ගාස්තු අයකරගත යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ජල ව්‍යාපෘතිය යටතේ ලබාදී ඇති ජල සම්බන්ධතා සඳහා ජල මනු සවි නොකිරීම හේතුවෙන් ගෘහස්ත ජල සම්බන්ධතා වෙනුවෙන් රු. 100 සිට රු. 250 ක් දක්වා ද ව්‍යාපාරික ස්ථානයක් සඳහා රු. 1,250 සිට රු. 3,750 ක් දක්වා ද මාසික ගාස්තුවක් අයකිරීමට කටයුතු කර තිබුණි. | ජල මනු සවි කිරීම සඳහා මූලික වියදම මේ වන විට සභාවට දැරීමට අපහසු බැවින් සහ පොදු මහජනතාව ගේ සුභ සිද්ධිය වෙනුවෙන් ජලය සැපයීම සිදුකරන බැවින් ඉදිරියේදී පළාත් නිෂ්චිත අරමුදල යටතේ ජල මනු 162 ක් සවිකිරීමට ඇස්තමේන්තු සකස් කර ඇති බව. | ජලය ලබාදීමේ කටයුතු විධිමත්ව කළමනාකරණය කළ යුතුය. |
| (ආ) සභාවට අයත් නව බස් නැවතුම්පොල කඩ කාමර අංක 01 හා 02 බදු දීමේදී පිළිවෙලින් පාර්ශවයන් 05 ක් සහ 04 ක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර කඩ කාමර අංක 01 සඳහා පලමු වැඩිම ලංසු 02 ක එක් පාර්ශවයක් විසින්ද තෙවන හා සිව්වන ලංසු දෙක තවත් පාර්ශවයක් විසින්ද කඩ කාමර අංක 02 ට අදාලව පළමු ලංසු 03 එකම පාර්ශවයක් විසින්ද ඉදිරිපත් කර තිබුණි. එකම කඩ කාමරයක් සඳහා එක් පාර්ශවයකට මිල ගණන් කිහිපයක් ඉදිරිපත් කළ නොහැකි වුවත් ඒ පිළිබඳ සලකා බැලීමකින් තොරව කඩ කාමර බදුදීම සිදුකර තිබුණි. | මෙලෙස ටෙන්ඩරය පිරිනමන ලද්දේ ආයතනය කෙරෙහි සත්භාවයෙන් යුතුව බව. | ප්‍රසම්පාදන කටයුතු විනිවිදභාවයෙන් යුතුව සිදුකළ යුතුය. |
| (ඇ) ප්‍රාදේශීය සභාව විසින් 2016 සිට 2020 වර්ෂය දක්වා ඉදිරිපත් කරන ලද අනුමත නොකල ගොඩනැගිලි සැලසුම් 32 ක් සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගොඩනැගිලි අයදුම්පත්වල පවතින අඩුපාඩු නිසා එසේ අනුමත කිරීමට නොහැකි වූ අතර දැනට ඉදිරිපත් කරන ගොඩනැගිලි අයදුම්පත්‍ර සම්බන්ධයෙන් නිරන්තර පසු විපරම් කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇති බව. | බලප්‍රදේශයේ සිදු කරන ඉදිකිරීම් කටයුතු නියාමනය කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| (අ) දේපල වාර්ෂිකව බදු දීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතු වුවද ප්‍රාදේශීය සභාවට අයත් අංක 03 ගවමස් කඩය 2023 වර්ෂය සඳහා බදු දීමේදී ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කිරීමකින් තොරව 2022 වර්ෂයේ බදුකරු වෙතම බදුදීමට කටයුතු කර තිබුණි. | ප්‍රාදේශීය සභා තීරණයකට අනුව බහුතර මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ටෙන්ඩරයකින් තොරව බදුදීමට කටයුතු කර ඇති බව. | සභාව සතු දේපල බදු දීමේදී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කළ යුතුය. |
| (ආ) ප්‍රාදේශීය සභාවට අයත් දේපල 03 ක් බදු ගිවිසුම් කොන්දේසි අනුව මාසික ජල සහ විදුලි බිල්පත් අදාල බදුකරු විසින් ගෙවීම් කළ යුතු වුවත් සභාව විසින් දේපල 03 කට අදාලව රු. 347,588 ක ජල බිල්පත් පියවා තිබුණි. | මෙම ජල මනු බදුකරුට අමතරව වෙනත් පාර්ශවයක්ද ජලය පරිභෝජනය කරන බැවින් බිල්පත් ගෙවීමට නොහැකි බව බදුකරු දැනුම් දුන් පසු සභාපතිවරයාගේ ලිඛිත නියෝග මත බිල්පත් ගෙවන ලද අතර දැනට නව ජල මනු සවිකිරීමට කටයුතු සිදුකරන බව. | ගිවිසුමේ කොන්දේසි අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) තොග පොළ භූමියේ අංක 7,8,9 හා 11 යන කඩ කාමර බදුගත් පාර්ශව විසින් වෙනත් පාර්ශවයන් වෙත කඩ කාමර පවරා දිමක් සිදුකර තිබුණු අතර කඩ කාමර පැවරිම සම්බන්ධයෙන් කිසිදු කොන්දේසියක් බදු ගිවිසුමේ ඇතුලත් කර නොතිබුණි. | සභාවේ එකඟතාවය නොමැතිව වෙනත් පාර්ශවයක් වෙත පවරා ඇති අතර ඉදිරියේ ඊට අදාල කොන්දේසි ඇතුලත් කරමින් නව ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතවීමට කටයුතු කරන බව. | කඩ කාමර බදුදීමේදී ඊට අදාල සියලු කොන්දේසි බදු ගිවිසුමට ඇතුලත් කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයට අදාලව රු. 31,683,745 ක මුදලක් වැයකර ආදාහනාගාරය සඳහා ගෑස් සිලින්ඩර් 185 ක් මිලදීගෙන තිබුණු අතර ආදාහනාගාරයට ගෑස් තොග ගබඩාව හරහා නිකුත් කිරීමේ වැඩ පිළිවෙලක් ස්ථාපිත කර නොතිබුණි. | ආරක්ෂිත ගබඩා පහසුකම් නොමැතිවීම, ප්‍රවාහන ගැටළු, නිවාඩු දිනවල ගෑස් නිකුත් කිරීමේ ගැටළු හේතුවෙන් සභා කාර්යාලයේ ගබඩාව හරහා නිකුත් නොකර ආදාහනාගාර භූමිය තුලම ගෑස් ගබඩා කර තැබීම සිදු කරන ලද අතර ඉදිරියේදී මෙම කටයුතු විධිමත් කරන බව. | සභාව සතු වත්කම් කාර්යක්ෂමව කළමනාකරණය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ආදාහනාගාරයේ පවත්වාගෙන යනු ලබන ලේඛනය අනුව 2023 ජනවාරි 01 දිනට ඉතිරි ගෑස් ප්‍රමාණය (ශේෂය) ඉදිරියට ගෙනවිත් නොතිබුණු අතර 2023 වර්ෂය තුළ මිලදී ගත් ගෑස් සිලින්ඩර් 185 කින් ගෑස් සිලින්ඩර් 152.15 ක් භාවිතා කර තිබුණි. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනට ඉතිරි ගෑස් ප්‍රමාණය ගෑස් සිලින්ඩර් 32.85 ක් විය යුතු වුවත් සිලින්ඩර් 3.52 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු. 509,912 ක ගෑස් සිලින්ඩර් 29.10 ක ඌනතාවයක් පැවතුණි. | අධීක්ෂණ නිලධාරීන් ලවා පොත් පරීක්ෂා කළ අතර පොත්වල සටහන් කිරීමේදී අතපසුවීම් සිදු වී ඇති බවත් ඉතිරි ගෑස් ප්‍රමාණය නිවැරදි බව. | සභාව සතු වත්කම්වල උපයෝජනය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) ගිනි නිවීමේ රථයෙහි මයිලෝ මීටරය කිලෝමීටර 65616 ලෙස සටහන්ව තිබුණද ධාවන සටහන් පොත අනුව එහි මීටරය කිලෝ මීටර් 66325 ක් ලෙස සටහන්කර තිබුණි. මේ අනුව ධාවනය නොකළ කිලෝ මීටර් 709 ක් වෙනුවෙන් ඉන්ධන ලීටර් 177 ක් ලබාගෙන ඇති බව නිරීක්ෂණය විය. | මේ පිළිබඳ වාහනය භාර රියදුරු ගෙන් හේතු විමසා ලිඛිතව කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති බව. | සභාව සතු වත්කම් උපයෝජනය විධිමත්ව සිදුකළ යුතුය. |
| (ඈ) සභාව සතු ඩ්‍රම් ට්‍රක් රථයේ ලියාපදිංචි සහතිකය අනුව සහ වාහනයේ සඳහන් චැසි අංකය වෙනස් බව නිරීක්ෂණය වූ අතර මෙම රථය සඳහා 2019 වර්ෂයෙන් පසුව ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | වාහන ගෙන්වීමට මැදිහත් වූ සමාගම විසින් පරීක්ෂා කිරීමකින් තොරව සිදුකර ඇති ක්‍රියාවන් හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇති බව හා මෙම දෝෂය නිවැරදි කරනු ලැබුවහොත් අදාල ලේඛන නිවැරදි කළ හැකි බව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් පවසන ලද බව. | සභාව සතු වත්කම්වල අයිතිය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් අවධානය යොමුකළ යුතුය. |
| (ඉ) සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 04 ක නීත්‍යානුකූල අයිතිය පවරාගෙන නොතිබුණි. | අදාල වාහන සභාවට පවරා ගැනිමට කටයුතු සිදුකරමින් පවතින බව. | සභාව සතු වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරාගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) සභාව සතු ටිපර් රථය 2023 ජූලි 07 දින සිට අලුත්වැඩියා කටයුත්තක් සඳහා ධාවනය නතර කර තිබුණු අතර 2023 ඔක්තෝබර් 18 දින වන විටත් අලුත්වැඩියා කර නොතිබුණි. අලුත්වැඩියාව සඳහා ධාවනය නතර කළ දිනට දෛනික ධාවන සටහන් පොත අනුව මයිලෝමීටරය කිලෝමීටර් 57885 ක් වුවත් 2023 ඔක්තෝබර් 18 දින වාහනයේ මයිලෝමීටරය කිලෝමීටර් 63823 ක් ලෙස සටහන්ව තිබුණි. මේ අනුව දෛනික ධාවන සටහන් පොතට වඩා වාහනයේ මයිලෝ මීටරය කිලෝමීටර් 5938 ක් වැඩියෙන් ධාවනය කර තිබුණි. මේ අනුව රාජකාරී කටයුතුවලින් බැහැරව කිලෝමීටර් 5938 ක් ධාවනය කර ඇති බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධව වාහනය භාර රියදුරුගෙන් කරුණු විමසා ඇති අතර රියදුරු මහතාගෙන් තොරතුරු ලබා ගැනීමෙන් අනතුරුව ඒ සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | සභාව සතු වත්කම් උපයෝජනය සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමුකළ යුතුය. |
| (උ) සභාව සතු මොනරාගල පොතුවිල් පාරේ පිහිටි පර්චස් 03 ක බිම් කොටස පෞද්ගලික රෙදිපිළි අලෙවි කිරීමේ ආයතනයක් විසින් පරිහරණය කරන බැවින් ඊට විරුද්ධව සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඉදිරියේදී අදාල ඉඩම් කොටස් මැනුම් කර නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | සභාව සතු දේපලවල ආරක්ෂාව තහවුරු කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන තීරණ නොමැතිව හා ප්‍රසම්පාදන තීරණයේ අදාල මිල ගණන් නොමැතිව වැලියාය පෙර පාසලට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම, සභාවට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම, සේවක නිල ඇඳුම් මිලදී ගැනීම හා අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු. 395,393 ක වියදමක් දරා තිබුණි. | වතුර මෝටරය වසර කිහිපයකට පෙර එම පෞද්ගලික ආයතනයෙන් මිලදී ගෙන තිබුණු බැවින් අලුත්වැඩියාවට අදාල මිල ගණන් කැඳවා නොමැති බව හා ප්‍රසම්පාදන තීරණ අංක 85 ට අදාල මිල කැඳවීම් වැරදීමකින් තීරණ අංක 94 ගොනුවට ඇතුලත්ව ඇති බවත් ඉදිරියේදී එවැනි අතපසුවීම් මගහරවා ගන්නා බව. | ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව සහ විනිවිදභාවයෙන් යුතුව සිදුකළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සෞඛ්‍ය අංශයට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් 2023 අප්‍රේල් 10 දිනැති අංක 16 දරන වවුචරය මගින් රු. 102,000 ක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණු අතර 2023 ප්‍රසම්පාදන තීරණ අංක 40 අනුව මිලදී ගැනීම් සිදුකර තිබුණි. එම තීරණය අනුව තෝරා ගත් ආයතනයෙන් බැහැරව මිලදී ගෙන තිබුණු අතර මිලදී ගන්නා ලද ආයතනයට අදාලව මිල කැඳවීමක් හෝ සිදුකර නොතිබුණි. | අවම මිල ගණන් ඉදිරිපත් කළ ආයතනයෙන් භාණ්ඩ සැපයීමට කටයුතු නොකළ නිසා එම මිල ගණන් යටතේ වෙනත් ආයතනයකින් මිලදී ගත් අතර ඒ සඳහා මිල කැඳවීම් කරන ලද බවත් ප්‍රසම්පාදන තීරණය සටහන් කිරීම අතපසු වී ඇති බවත් දන්වමි. ඉදිරියේදී එවැනි මගහැරීම් වලක්වා ගන්නා බව. | ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව සහ විනිවිදභාවයෙන් යුතුව සිදුකළ යුතුය. |
| (ඇ) ප්‍රාදේශීය සභාවේ ගිණිබට අංශයේ නිලධාරීන්ට නිල ඇඳුම් මිලදී ගැනීම සඳහා 2023 වර්ෂයේ රු. 293,600 ක මුදලක් ගෙවා තිබුණි. මෙම මිලදී ගැනීම 2023 අංක 63 දරන ප්‍රසම්පාදන තීරණයට අනුව මිලදී ගැනීම් සිදු කළ බව දන්වා තිබුණත් එම තීරණයේ ගිනිබට නිලධාරීන් සඳහා ආරක්ෂිත සපත්තු මිලදී ගැනීම සඳහා පමණක් සිදුකර තිබුණි. ඒ අනුව නිල ඇඳුම් මිලදී ගැනීම සඳහා මිල කැඳවීම් කර නොතිබුණි. | ඇඳුම් කට්ටලයක මිල සඳහන් කර නොතිබීම හේතුවෙන් එම ආයතනයට අදාල ඉන්වොයිසියක් මගින් මිල ඉදිරිපත් කර එවන ලද අතර මුල් අවස්ථාවේ මිල සටහන් නොකර තිබීම හේතුවෙන් ප්‍රසම්පාදන තීරණ පොතෙහි සටහන් කිරීම අතපසු වී ඇති බව. | ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව සහ විනිවිදභාවයෙන් යුතුව සිදුකළ යුතුය. |
| (ඈ) මොනරාගල ප්‍රාදේශීය සභාව වොට් 15 ග්‍රීන් බල්බ් 1000 ක් මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර තිබුණු මිල ගණන් අනුව වසර 03 ක වගකීම් කාලයක් සහිතව එකක් රු. 1,535 කට සැපයිය හැකි ආයතනයෙන් මිලදී නොගෙන වසර 02 ක වගකීම් කාලයක් සහිතව එකක් රු. 2,350 ක් බැගින් වෙනත් ආයතනයකින් මිලදී ගැනීම හේතුවෙන් සභා අරමුදලට රු. 795,000 ක පාඩුවක් සිදු වි තිබුණි. | අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ආයතනයෙන් බල්බයක් රු. 1,335 ට ලබාදීමට නොහැකි බව දන්වන ලද අතර එම මිලට ලබා ගැනීමට නම් බල්බ් 500 ට වඩා වැඩි ප්‍රමාණයක් එකවර මිලදී ගතයුතු බවත් දන්වන ලදි. මිල ගණන් ඉදිරිපත් කරන ලද අනෙක් ආයතන වසර 03ක වගකීම් කාලයක්ද සමඟ බල්බයක් රු. 2,350කට ලබාදීමට එකඟ වූ අතර බල්බ් මාරු කිරීමේදී බල්බයේ අංකය සහ කාඩ්පතේ අංකය නොසලකා හැර මාරු කිරීමට එකඟවීම හේතුවෙන් එම ආයතනයෙන් බල්බ් මිලදී ගත් බව. | ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව සහ විනිවිදභාවයෙන් යුතුව සිදුකළ යුතුය. |

## 3.6 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|
| ----------------------- | ------------------------------ | ---------------- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 10 ක නිලධාරීන් 22 ක ගේ පුරප්පාඩු සහ තනතුරු 04 ක නිලධාරීන් 09 ක ගේ අතිරික්තයක් පැවතුණි. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පිළිබඳ පළාත් පාලන දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති අතර අතිරික්ත නිලධාරීන් සභාව විසින් ඉල්ලුම්කර ලබාගත් නිලධාරීන් නොවන බව. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පුරවාගත යුතු අතර අතිරික්ත කාර්ය මණ්ඩලයේ තනතුරු අනුමත කරගත යුතුය. |

## 4. <u>ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය</u>

### 4.1 <u>අයවැය පාලනය</u>

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|
| ----------------------- | ------------------------------------- | ----------------- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 08 ක සියයට 10 සිට සියයට 37 දක්වාද වියදම් විෂයයන් 07 ක සියයට 1 සිට සියයට 47 දක්වාද විචලනයන් පැවතුණි. | විවිධ අවස්ථාවල ගනු ලැබූ සාධනීය තීන්දු තීරණ හා ආදායම් අයකිරීමේ ක්‍රමෝපායන් මත ඇස්තමේන්තුගත ආදායමට සරිලන මුදලක් අයකර ගැනීමට නොහැකි වූ බව. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු වඩාත් තාත්විකව පිළියෙල කළ යුතු අතර එම ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |